සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

# Second Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

කාලය පැය දෙකයි

- **අංක 1 සිට 50 දක්වා එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර තෝරා නියමිත අංකයේ කතිරයක් (x) යොදන්න.**

01. සන්නිවේදන වර්ග සඳහා මූලික පදනම වන්නේ,
    1. සන්නිවේදන ස්වභාවය හා එයට සම්බන්ධවන පුද්ගල සංඛ්‍යාවයි
    2. ඒවා සමාජය තුළ දක්නට ලැබෙන ආකාරය අනුවයි
    3. ඒවා සමාජය තුළ භාවිත වන ආකාරය අනුවයි
    4. එක් එක් වර්ග සඳහා තාක්ෂණය භාවිත වන ආකාරය අනුවයි
    5. එක් එක් වර්ග පුද්ගලයා විසින් අවස්ථානුකූලව භාවිතා කරන ආකාරය අනුවයි

02. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
    1. සමස්ථ සන්නිවේදනයේ මූලාරම්භයයි
    2. මිනිස් මනස හා ඍජුවම සම්බන්ධ ක්‍රියාවලියකි
    3. පුද්ගලයා තුළ හෝ පුද්ගලයන් දෙදෙනෙකු අතර පමණක් ක්‍රියාත්මක වේ
    4. පුද්ගල මනෝභාවයන්, පෞද්ගලික අත්දැකීම් ආදිය තමන් තුළ විමර්ශණයට ලක්කිරීම සිදුවේ
    5. ස්වයං සන්නිවේදනය ලෙසද හැඳින්වේ

03. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ප්‍රයෝජනයකි.
    1. ආත්ම භාෂණ ක්‍රියාවලියක් වීම
    2. පෞරුෂ වර්ධනයට උපකාරී වීම
    3. පුද්ගල මතකය හා සම්බන්ධවීම
    4. ප්‍රතිචාර/ප්‍රතිපෝෂණයන් නිරායාසයෙන් සිදුවීම
    5. සිත හෙවත් මනස ප්‍රමුඛ වීම

04. අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණයක් නොවන්නේ,
    1. චින්තනය ගොඩනංවා ගැනීම
    2. පංචේන්ද්‍රියන්ට දැනෙන උත්තේජන අනුව ප්‍රතිචාර දැක්වීම
    3. සංජානනයන් අර්ථකථනය කරගත හැකිවීම
    4. ආත්මභාෂණ ක්‍රියාවලියක් වීම
    5. ප්‍රතිචාර/ප්‍රතිපෝෂණ නිරායාසයෙන් සිදුවීම

05. අභිමුඛ පුද්ගලාන්තර සන්නිවේදනය යනු,
    1. තාත්ෂණික උපකරණ මාර්ගයෙන් සජීවීව සන්නිවේදනයේ යෙදීම
    2. ඕනෑම ප්‍රදේශයක සිට තොරතුරු හුවමාරු කරගැනීමේ හැකියාව
    3. අන්තර්ජාල සේවාවන් ඔස්සේ තොරතුරු හුවමාරුව
    4. පුද්ගලයන් දෙදෙනෙකු මුහුණට මුහුණලා සජීවීව සන්නිවේදනයේ යෙදීම
    5. පුද්ගලයන් කිහිප දෙනෙකු තාක්ෂණය ඔස්සේ සජීවී ලෙස සන්නිවේදනයේ යෙදීම

06. අන්තර් පුද්ගල සනීවේදනයේ අරමුණක් නොවන්නේ,
1. තොරතුරු හුවමාරුව 2. අයැදීම 3. ආයාචනා කිරීම
4. ප්‍රශ්න විසඳගැනීම 5. පුද්ගල මතකය හා සම්බන්ධ වීම

07. අන්තර් පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණයක් නොවන්නේ,
1. පුද්ගලයන් දෙදෙනෙකු අතර සන්නිවේදනය සිදුවීම
2. මුහුණට මුහුණලා සන්නිවේදනයේ යෙදීමේ හැකියාව
3. බාධක අවම කරගත හැකිවීම
4. රහස්‍ය බව සුරැකීමේ හැකියාව
5. පංචේන්ද්‍රියන්ට දැනෙන උත්තේජන මත ප්‍රතිචාර සිදුවීම

08. සමූහ සන්නිවේදනය යනු,
1. පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදුවන සන්නිවේදනයයි
2. කිසියම් පිරිසක් හෙවත් සමූහයක් පොදු අරමුණක් ඇතිව එකට එක්ව සිදුකරන සන්නිවේදනයයි
3. සමූහයක් තවත් සමූහයක් ඇමතීමයි
4. එක් අයෙකු සමූහයකට ඇමතීමයි
5. සමූහයක් තවත් සමූහකට නව මාධ්‍ය තාක්ෂණය ඔස්සේ ඇමතීමයි

09. සමූහ සන්නිවේදනයේදී සන්නිවේදනයට ඉවහල් කරගත හැකි විධි ක්‍රමයක් නොවන්නේ,
1. පෙර සූදානම 2. අරමුණුසහගත බව
3. අවාචික සන්නිවේදන විධික්‍රම භාවිතය. 4. රහස්‍යභාවය සුරැකීමේ හැකියාව.
5. ප්‍රදීපාගාර උපක්‍රමය

10. ''කණ්ඩායම් නායකත්වය ඉස්මතු වීම'',
1. අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයේ ලක්ෂණයකි 2. සමූහ සන්නිවේදනයේ ලක්ෂණයකි
3. පුද්ගලාන්තර සන්නිවේදනයේ ලක්ෂණයකි 4. ජන සන්නිවේදනයේ ලක්ෂණයකි
5. අතථ්‍ය සන්නිවේදනයේ ලක්ෂණයකි

11. මහජන සන්නිවේදනය සිදුවන අවස්ථාවන් අයත් කාණ්ඩය තෝරන්න.
1. දුරකතන සංවාද, වීඩියෝ සම්මන්ත්‍රණ, දේශණ
2. ප්‍රසිද්ධ රැස්වීම්, වීඩියෝ සංවාද, දුරකතන සංවාද
3. ප්‍රසිද්ධ රැස්වීම්, දේශන, විවිධ සැමරුම් උත්සව
4. සමාජ ජාල භාවිතය, රූපවාහිනී සාකච්ඡා, පුවත්පත් දැන්වීම්
5. ගුවන් විදුලි සාකච්ඡා, රූපවාහිනී සංවාද, පුවත්පත් දැන්වීම්

12. ජන සන්නිවේදනය යනු,
1. විද්‍යුත් මාධ්‍ය උපයෝගී කරගනිමින් ජනස්කන්ධයකට සංදේශ මුදාහැරීමයි
2. මුද්‍රිත මාධ්‍ය හා නව මාධ්‍ය භාවිතයෙන් ජනස්කන්ධයකට සංදේශ මුදාහැරීමයි
3. ජනස්කන්ධයකට විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය භාවිත කරමින් සිදුකරනු ලබන සන්නිවේදනයයි
4. ජනමාධ්‍ය භාවිතා කරමින් විශාල ග්‍රාහක සංඛ්‍යාවකට තොරතුරු මුදාහැරීමයි
5. අන්තර්ජාල සේවා භාවිතාකරමින් ජනස්කන්ධයකට තොරතුරු මුදාහැරීමයි

13. ''වෘත්තීය සන්නිවේදකයන් යාන්ත්‍රික මාධ්‍ය වහල්කොටගෙන පුලුල් ලෙසත්, ක්ෂණිකවත් අඛණ්ඩවත් සංදේශය විශාලවූත් විවිධ වූත් ග්‍රාහක ක්ෂේත්‍රයන් වෙත පතුරුවමින් බලපෑමක් ඇතිකිරීමේ ක්‍රියාවලියයි.''
ජන සන්නිවේදනය පිළිබඳ මෙම ප්‍රකාශය ඉදිරිපත් කර ඇත්තේ,
1. මහාචාර්ය විල්බර් ග්‍රාම් 2. ඇරිස්ටෝටල් පඬිවරයා
3. ක්ලෝඩ් ශැනෝන් හා වොරන් වීවර් 4. ඩිෆ්ලුවර් සහ ඩෙනිස්
5. හැරල්ඩ් ඩී. ලැස්වෙල්

14. Hub ආකෘතිය ඉදිරිපත් කරන ලද්දේ,
   1. රේ. එල්ඩන් හයිබර්ට්, විල්බර් ශ්‍රාම්, තෝමස් ඩබ්ලිව්. බෝන් ය
   2. තෝමස් ඩබ්ලිව් බෝන්, රේ. එල්ඩන් හයිබර්ට්, ඩොනල්ඩ් ආර්. අන්ගුරේට් ය
   3. විල්බර් ශ්‍රාම්, වොරන් වීවර්. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය
   4. ඩොනල්ඩ් ආර්. අන්ගුරේට්. තෝමස් ඩබ්ලිව්. බෝර්න්. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය
   5. තෝමස් ඩබ්ලිව්. බෝන්, විල්බර් ශ්‍රාම්, වොරන් වීවර් ය

15. Hub ආකෘතිය තුළ ජන සන්නිවේදන ක්‍රියාවලියට සම්බන්ධ ප්‍රධාන අංග,
   1. හයකි. 2. පහකි. 3. හතකි. 4. හතරකි. 5. අටකි.

16. Hub ආකෘතියට අයත් අංගයක් නොවන්නේ,
   1. ප්‍රතිපෝෂණය 2. සන්නිවේදකයෝ 3. සංඥා 4. ජනමාධ්‍ය 5. පෙරහනු

17. ජන සන්නිවේදනය තුළ දොරටු පාලකයින් යනු,
   1. ජනමාධ්‍ය සංදේශ මුදාහරින්නන් ය.
   2. ජනමාධ්‍ය සංදේශ පාලනය කරන පුද්ගලයන්ය
   3. විදුලි සංදේශ සේවා නියාමන කොමිෂන් සභාවයි.
   4. පෙරහනු ලෙස ක්‍රියාත්මක වන්නන් ය
   5. අතීතයේ රජවාසල පැවති චරිතයකි.

18. ජන සන්නිවේදනය සතු විශේෂ ලක්ෂණයක් නොවන්නේ,
   1. විධිමත් සංවිධානගත ආයතනික ව්‍යුහය
   2. පොදු පණිවිඩ විසරණය
   3. අසීමාන්ත ග්‍රාහක සංඛ්‍යාවක් සිටීම
   4. අන්තර්ජාල සේවා හා සමාජජාල භාවිතය
   5. වෘත්තීය සන්නිවේදනයෙන් දක්නට ලැබීම

19. අතථ්‍ය සන්නිවේදනයේ ප්‍රධාන සංරචකය වන්නේ,
   1. නව මාධ්‍ය භාවිතය යි
   2. විද්‍යුත් තැපැල් හා කෙටිපණිවිඩ යි
   3. අන්තර් ජාලයයි
   4. වෙබ් අඩවි සහ මාර්ගගත කතාබහයි
   5. වීඩියෝ සම්මන්ත්‍රණ හා සමාජ ජාල භාවිතයයි

20. අතථ්‍ය සන්නිවේදනය පිළිබඳ සංකල්පය සංවර්ධනය වන්නේ,
   1. 20 වන සියවසෙන් පසු තාක්ෂණික දියුණුව තුළ ය
   2. 21 වන සියවසේ බිහිවන සංකල්පයක් ලෙස ය
   3. 70 දශකයේ අංකිත තාක්ෂණයේ දියුණුවත් සමගය
   4. 50-60 දශක වල යුරෝපයේ ය
   5. අන්තර්ජාලයේ ව්‍යාප්තියත් සමගමය

21. වාචික සන්නිවේදනය යනු,
   1. වචන භාවිතයෙන් තොරව සිදුවන සන්නිවේදනයයි
   2. කිසියම් භාෂාවක් පදනම් කරගෙන වචන භාවිතයෙන් සිදුකෙරෙන සන්නිවේදනයයි
   3. මුවින් පිටවන වචන හා ශබ්ද අනුසාරයෙන් විවිධ අර්ථ ජනනය කිරීම යි
   4. සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර වාචික සන්දේශ හුවමාරු කිරීමයි
   5. අපගේ හැඟීම් වචන ඔස්සේ සන්නිවේදනය කිරීමයි

22. නිර්වාචික සන්නිවේදනයේ ප්‍රධාන කොටස් 02,
   1. අංග චලන සහ දේශ භාෂාවයි
   2. ශ්‍රව්‍ය සංඥා සහ දෘෂ්‍ය සංඥා යි.
   3. ඉරියව් හා අභිනයන්ය
   4. ප්‍රාදේශීය සංඥා සහ ලෝකය පුරා භාවිත වන සංඥා ය
   5. සංඥා භාෂාව සහ දේහ භාෂාවයි

23. නිහඬ සිනමාව අයත් වන්නේ,
   1. කථන සන්නිවේදනයට ය
   2. දෘෂ්‍ය සන්නිවේදනයටය
   3. ශ්‍රව්‍ය සන්නිවේදනයටය
   4. වාචික සන්නිවේදනයටය
   5. විධිමත් හා අවිධිමත් සන්නිවේදනයට ය

24. ජන ශ්‍රැතිකාංග මුඛ පරම්පරාගතව පැවත ඒම දක්නට ලැබෙනුයේ,
   1. දෘෂ්‍ය සන්නිවේදනය තුළ ය
   2. කථන සන්නිවේදනය තුළ ය
   3. ශ්‍රව්‍ය සන්නිවේදනය තුළ ය
   4. වාචික සන්නිවේදනය තුළ ය
   5. ජන සන්නිවේදනය තුළ ය

25. දෘෂ්‍ය සන්නිවේදනය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. ඇසින් දකින දෙයෙහි සීමාවක් නැත
   2. ප්‍රාථමික මානව සමාජවල පටන් පැවත ඒ
   3. ආදි මානවයා සිය අත්දැකීම් අන් අයට පිළිබිඹු කිරීමට යොදාගත් උපක්‍රමයකි
   4. දැකීමෙන් හා බැලීමෙන් අත්පත්වන අදහසකි
   5. මිනිසාගේ සැකය හා කුතුහලය ප්‍රයෝජනයට ගනිමින් ක්‍රියාත්මක වේ

26. සන්නිවේදනය පිළිබඳ ආකෘති ඉදිරිපත් කළ විද්වතුන් අතරට අයත් නොවන්නේ,
   1. ඇරිස්ටෝටල්
   2. හැරල්ඩ් ඩී. ලැස්වෙල්
   3. වෝල්ටර් ලිප්මාන්
   4. ක්ලෝඩ් ශැනෝන් හා වොරන් වීවර්
   5. විල්බර් ශ්‍රාම් සහ ඔස්ගුඩ්

27. ඇරිස්ටෝටල් ආකෘතියේ මූලිකාංග
   1. පහකි  2. හයකි  3. හතරකි  4. හතකි  5. තුනකි

28. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතිය,
   1. චක්‍රාකාර ආකෘතියකි
   2. රේඛීය ආකෘතියකි
   3. සන්නිවේදකයා හා ග්‍රාහකයා පමණක් විග්‍රහ කරන ආකෘතියකි
   4. පූර්ණ සන්නිවේදන ක්‍රියාවලියක් විග්‍රහ කරන ආකෘතියකි
   5. නිශ්චිත අරමුණක් පෙරදැරිව සන්නිවේදනය සිදුකරන බව පවසයි

29. මානව මෙහෙවරකින් තොරව තාක්ෂණික දෘෂ්ටිකෝණයකින් සන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කර ඇති සන්නිවේදන ආකෘතිය වනුයේ,
   1. ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියයි
   2. ඇරිස්ටෝටල් ආකෘතියයි
   3. ශැනෝන් සහ වීවර් ආකෘතියයි
   4. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතියයි
   5. ජෝර්ජ් ගබ්නර් ආකෘතියයි

- **ප්‍රශ්න අංක 30. 31. 32 යන ප්‍රශ්න සඳහා රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**



30. ඉහත ආකෘතියට අනුව ෂැනෝන් හා වීවර් විග්‍රහ කරන ආකාරයට D යනු,
   1. තොරතුරු මූලාශ්‍රය යි
   2. ආකේතිකරණය යි
   3. බාධක යි
   4. සන්දේශ අන්තය යි
   5. විකේතී කරණයයි

31. යම් සංදේශයක් D සිට A දක්වා නැවත ගමන් කිරීම සිදුවන්නේනම්,
   1. ඇරිස්ටෝටල් ආකෘතියට සමාන වේ
   2. හැරල්ඩ් ඩී. ලැස්වෙල් ආකෘතියට සමාන වේ
   3. ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියට සමාන වේ
   4. ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතියට සමාන වේ
   5. ජෝර්ජ් ගබ්නර් ආකෘතියට සමාන වේ

32. මෙම රූපසටහන තුළ E කොටසට අයත්වන්නේ,
1. තාක්ෂණික බාධක හා පාරිසරික බාධකය
2. අර්ථ බාධක හා මාධ්‍ය බාධක ය
3. මානසික බාධක හා තාක්ෂණික බාධක ය
4. පාරිසරික බාධක හා ආර්ථික බාධක ය
5. ස්වභාවික බාධක හා සැලසුම් සහගත බාධක ය

33. ඔස්ගුඩ් ශ්‍රාම් ආකෘතියේ පොදු අදහස,
1. තොරතුරු එක් දිශාවකට පමණක් ගමන් කරන බව පෙන්වයි
2. සන්නිවේදකයාගේ හා ග්‍රාහකයාගේ අත්දැකීම් පසුතලය පිළිබඳ විග්‍රහ කරයි
3. සන්නිවේදන ක්‍රියාවලියේ බාධක පිළිබඳ විග්‍රහ කරයි
4. සන්නිවේදකයාට අත්‍යවශ්‍ය වන ප්‍රතිචාර හා ප්‍රතිශේෂණය පිළිබඳ කියැවේ
5. සන්නිවේදන ක්‍රියාවලියේ අඛණ්ඩ බව කියැවේ

34. සන්නිවේදන ක්‍රියාවලිය තුළ බලපෑම යනු,
1. සන්නිවේදකයා විසින් ග්‍රාහකයා වෙත ඇතිකරනු ලබන තත්ත්වයකි
2. සංදේශය මගින් ඇතිකරන වෙනසයි
3. ග්‍රාහකයා විසින් සන්නිවේදකයාවෙත නැවත ලබාදෙන ප්‍රතිචාරය යි
4. පණිවිඩය ග්‍රාහකයා වෙත ලැබීමෙන් පසු ඔහු තුළ ඇතිවන ක්‍රියාකාරී වෙනසයි
5. ග්‍රාහක ප්‍රතිචාරය තුළින් සන්නිවේදකයා තුළ ඇතිවන වෙනසයි

35. සරල ආකෘති, සේවා අන්තර්ගතය, නම්‍යශීලීබව, ආදිය දක්නට ලැබෙන්නේ,
1. ජනමාධ්‍ය තුළ ය
2. නූතන මාධ්‍ය තුළ ය
3. නවමාධ්‍ය තුළය
4. සමාජ මාධ්‍ය තුළ ය
5. සාම්ප්‍රදායික මාධ්‍ය තුළය

36. ජන කවි සම්ප්‍රදායේ දක්නට නොලැබෙන ලක්ෂණයකි.
1. උඩරට පහතරට හා සබරගමු වශයෙන් වෙන්ව පැවතීම
2. මුඛ පරම්පරාගතව පැවතීම
3. සරල භාෂාවකින් නිර්මාණය වී තිබීම
4. නිර්මාණකරුවා කවුරුන්දැයි නොදැනීම
5. විශාල ප්‍රදේශයක පැතිර පැවතීම

37. ප්‍රාදේශීය වාග් ව්‍යවහාර වඩාත් පැහැදිලි ලෙස දක්නට ලැබෙන්නේ,
1. ජනකවි තුළය
2. ගැමි නාටක තුළය
3. ජන කථා තුළය
4. ජන රංග කලා තුළය
5. ශාන්ති කර්ම හා යාතුකර්ම තුළය

38. ''සමාජ උරුමය අඛණ්ඩව ව්‍යාප්ත කිරීම'' ජනමාධ්‍යයට අයත් භූමිකාවක් ලෙස දක්වා ඇත්තේ,
1. මහාචාර්ය විල්බර් ශ්‍රාම් ය
2. ආචාර්ය හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය
3. ඇරිස්ටෝටල් පඬිවරයා ය
4. කර්ට් ලෙවින් ය
5. පෝල එෆ්. ලැසාර්ස් ෆේල්ඩ් ය

39. ගුවන් විදුලි මාධ්‍යයෙහි ලක්ෂණයක් නොවන්නේ,
1. හඬ ආත්මය කර ගැනීම
2. එක් දිශානතියකට පමණක් පණිවිඩ ගෙන යාම
3. සරළ සංකීර්ණ ලෙස වැඩසටහන් නිර්මාණය වීම
4. ප්‍රතිචාර ප්‍රතිපෝෂණ ක්ෂණිකව සිදුවීම
5. හඬ මගින් චිත්තරූප මැවීමේ හැකියාව

40. රජයේ ලියාපදිංචි කල ප්‍රථම සිංහල පුවත්පත,
1. ලංකා ලෝකයයි
2. සිංහල බෞද්ධයා යි
3. ලක්මිණි පහණ යි
4. ද කලම්බු ජර්නල් පුවත්පතයි
5. රජයේ ගැසට් පත්‍රයයි

41. ශ්‍රී ලංකාවේ ප්‍රථම කථානාද චිත්‍රපටය,
1. නිධානය 2. රේඛාව 3. කඩවුණු පොරොන්දුව 4. වැලිකතර 5. මාතලන්

42. ජෝන් ලොගී බෙයාර්ඩ් සාර්ථක රූපවාහිනී ක්‍රමයක් ඉදිරිපත් කරන ලද්දේ,
1. 1936 2. 1887 3. 1953 4. 1926 5. 1873

43. නව මාධ්‍ය පිළිබඳ පර්යේෂණ කල විද්වතුන් අතරට අයත් නොවන්නේ,
1. මාර්ශල් මැක්ලුහන් 2. ෆෙඩ්රික් කෙට්ලර් 3. බර්නාඩ් ස්ටෙග්ලර්
4. කර්ට් ලෙවින් 5. මැනුවෙන් කැස්ටෙල්

44. සමාජ මාධ්‍ය වල ප්‍රභව අංග වනුයේ,
1. දුරකථනය හා ගුවන්විදුලිය 2. රූපවාහිනිය හා අන්තර්ජාලය
3. පුවත්පත හා අන්තර්ජාලය 4. සමාජජාල හා ජංගම දුරකථනය
5. දුරකථනය හා අන්තර්ජාලය වේ.

45. නව මාධ්‍ය සතු ලක්ෂණයක් නොවන්නේ,
1. ප්‍රමාදී ප්‍රතිපෝෂණය. 2. සංඛ්‍යාංකකරණය 3. ජාලගතකරණය
4. අන්තර් ක්‍රියාකාරිත්වය 5. අධිපාඨනීයත්වය.

46. සමාජ මාධ්‍ය යන වචනය,
1. කොටස් 4ක සංකලනයකි. 2. කොටස් 6ක සංකලනයකි
3. කොටස් 5ක සංකලනයකි. 4. කොටස් 8ක සංකලනයකි
5. කොටස් 3ක සංකලනයකි.

47. 50% කට වැඩි පිරිසක් කාන්තාවන් පරිශීලකයන් ලෙස දැකිය හැකි සමාජ මාධ්‍ය වනුයේ,
1. Linkedin 2. Instagram 3. Pinterest 4. Skype 5. Viber

48. සමාජ මාධ්‍ය විසින් ඇතිකරන සෘණාත්මක බලපෑමක් නොවන්නේ,
1. මානසික අවපීඩනය, හුදෙකලාව ආදිය ඇතිවීම
2. ග්‍රාහකයන් ළබැඳියන් වී තිබීම
3. පෞද්ගලිකත්වය පිළිබඳව ගැටළු මැවීම
4. පරිහරණය කරන කොටස් සංස්කරණය කළහැකි වීම
5. සයිබර් හිරිහැර

49. ජාතික අධ්‍යාපන ආයතනය විසින් පාසැල් අධ්‍යාපනයට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය විෂයයක් ලෙස හඳුන්වාදෙන ලද්දේ,
1. 2006 වසරේ දීය 2. 2007 වසරේ දීය 3. 2008 වසරේදීය
4. 1973 වසරේදී ය 5. 2011වසරේදී ය

50. ''මාධ්‍ය අධ්‍යයනය'' යනු,
1. සන්නිවේදන නිර්වචන, පදනම, ආකෘති ආදිය පිළිබඳ හැදෑරීමයි
2. නවමාධ්‍ය, නූතන මාධ්‍ය, ජනමාධ්‍ය ආදිය පිළිබඳව න්‍යායාත්මකව හැදෑරීමයි
3. අන්තර්ජාලය හා බැඳුණු මාධ්‍ය ක්‍රියාවලිය පිළිබඳ හැදෑරීමයි
4. මාධ්‍ය සාක්ෂරතාව සමාජයට ලබාදීමයි
5. මාධ්‍ය පිළිබඳව ඉගෙනීම, හැදෑරීම, මාධ්‍යයේ ස්වභාවය අන්තර්ගතය පරිණාමය හා ක්‍රියාකාරිත්වය ආදිය පිළිබඳ හැදෑරීමයි

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

29 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019
Second Term Test - Grade 12 - 2019

විභාග අංකය ............................ **සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II** කාලය පැය තුනයි

- **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) සන්නිවේදනය පිළිබඳ චාල්ස් කුලීගේ නිර්වචනය දක්වන්න. (ල. 2)
 (ii) ''සන්නිවේදනය බලය වේ'' පැහැදිලි කරන්න. (ල. 4)
 (iii) යුනෙස්කෝ සංවිධානය විසින් පාසල් ප්‍රාථමික ශ්‍රේණියේ සිට සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යාපනය ලබාදිය යුතු බවට නිර්දේශ කිරීමට හේතු වූ කරුණු කාරණා පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 6)
 (iv) විචාරශීලී මාධ්‍ය පරිහරණය වර්තමාන සමාජයට අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්වී ඇත. කාලීන මාධ්‍ය ක්‍රියාකාරිත්වය ඇසුරින් විචාරශීලීව විග්‍රහ කරන්න. (ල. 8)

02. (i) සන්නිවේදන වර්ග 4ක් නම් කරන්න. (ල. 2)
 (ii) මහජන සන්නිවේදනය අර්ථකථනය කර එහි ලක්ෂණ 4ක් දක්වන්න. (ල. 4)
 (iii) ගුවන් විදුලියේ මූලික ලක්ෂණ 3ක් දක්වා ගුවන් විදුලි මාධ්‍ය පිළිබඳ විස්තර කරන්න. (ල. 6)
 (iv) ජනසන්නිවේදන ක්‍රියාවලිය විග්‍රහ කිරීමට යොදාගන්නා HUB ආකෘතිය දක්වා එහි ප්‍රධාන අංග 08 පිළිබඳ විස්තර කරන්න. (ල. 8)

03. (i) අන්තර් පුද්ගල සන්නිවේදනයේලක්ෂණ 4ක් දක්වන්න. (ල. 2)
 (ii) අන්තර් පුද්ගල සන්නිවේදනය සිදුවන ප්‍රධාන ආකාර දෙක දක්වා එක් උදාහරණය බැගින් ගෙන කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)
 (iii) කෙටි සටහන් ලියන්න.
 1. ජන කවි
 2. ජන කථා
 3. ශාන්තිකර්ම හා යාතුකර්ම (ල. 6)
 (iv) වර්තමාන සමාජ මාධ්‍ය සතු කාර්යභාරය පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 8)

04. (i) වාචික සන්නිවේදනය අර්ථකථනය කර එහි කාර්යයන් 4ක් දක්වන්න. (ල. 2)

(ii) අතථ්‍ය සන්නිවේදනයේ ලක්ෂණ හතරක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) සන්නිවේදනය පිළිබඳ ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය දක්වන්න. (ල. 6)

(iv) පාසලේ ජන මාධ්‍ය සඟරාවට 'ජන සන්නිවේදන විකාශනයේ වැදගත් සංධිස්ථාන' මැයෙන් ලිපියක් සකස් කරන්න. (ල. 8)

05. (i) නව මාධ්‍ය භාවිතයේ දී තිබිය යුතු නිපුණතා 4ක් දක්වන්න. (ල. 2)

(ii) 'එඩ්වින් එමරි' විසින් විග්‍රහ කරන ලද පුවත්පතක දක්නට ලැබෙන ලක්ෂණ 4ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 4)

(iii) සන්නිවේදන ස්වරූප තුනක් විස්තර කරන්න. (ල. 6)

(iv) වර්තමාන ජනමාධ්‍ය වඩාත් ප්‍රමුඛතාවය ලබාදෙනුයේ විනෝදාස්වාද සම්පාදන කාර්යය කෙරෙහිය. පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න. (ල. 8)

06. (i) 'සන්නිවේදනය විවිධාකාර වේ.' කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 2)

(ii) ජන සන්නිවේදනයට අයත් ලක්ෂණ හතරක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න (ල. 4)

(iii) සාම්ප්‍රදායික සන්නිවේදනයේ වැදගත්කම කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 6)

(iv) ආයතනයක අභ්‍යන්තර කාර්ය මණ්ඩලය වෙත තොරතුරු බෙදා හැරීම සඳහා සහ ඔවුනොවුන් අතර යහපත් සන්නිවේදන සබඳතා වර්ධනය කිරීම සඳහා යොදාගත හැකි සමාජ මාධ්‍ය හතරක් නම් කර ඒවා යොදාගත හැකි ආකාරය පිළිබඳව උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල. 8)

07. (i) සමාජ මාධ්‍ය විසින් සමාජය මත ඇතිකරන සෘණාත්මක බලපෑම් හතරක් දක්වන්න. (ල. 2)

(ii) නව මාධ්‍ය පිළිබඳ තොරතුරු හුවමාරු කිරීමේදී වර්ගීකරණය වන කාණ්ඩ හතර දක්වන්න. (ල. 4)

(iii) ජනමාධ්‍ය වර්ගීකරණය තුළ මුද්‍රිත මාධ්‍ය යටතේ දක්නට ලැබෙන පුවත්පත හා වාරසඟරා පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ල. 6)

(iv) ජනමාධ්‍ය නියාමනය වර්තමාන සමාජයට කෙතෙක් දුරට අවශ්‍ය ද? කාලීන ජනමාධ්‍ය ක්‍රියාකාරිත්වය ඇසුරින් විමර්ශණාත්මකව විග්‍රහ කරන්න. (ල. 8)

**දෙවන වාර පරීක්ෂණය - 2019 - 12 ශ්‍රේණිය - සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය**

# I කොටස

**පිළිතුරු පත්‍රය**

| | | | | |
|---|---|---|---|---|
| **01.** - 1 | **11.** - 3 | **21.** - 5 | **31.** - 4 | **41.** - 3 |
| **02.** - 3 | **12.** - 3 | **22.** - 5 | **32.** - 2 | **42.** - 4 |
| **03.** - 2 | **13.** - 4 | **23.** - 2 | **33.** - 5 | **43.** - 4 |
| **04.** - 1 | **14.** - 2 | **24.** - 3 | **34.** - 4 | **44.** - 5 |
| **05.** - 4 | **15.** - 5 | **25.** - 4 | **35.** - 5 | **45.** - 1 |
| **06.** - 5 | **16.** - 1 | **26.** - 3 | **36.** - 1 | **46.** - 2 |
| **07.** - 5 | **17.** - 2 | **27.** - 1 | **37.** - 3 | **47.** - 3 |
| **08.** - 2 | **18.** - 4 | **28.** - 2 | **38.** - 2 | **48.** - 4 |
| **09.** - 4 | **19.** - 3 | **29.** - 2 | **39.** - 4 | **49.** - 1 |
| **10.** - 2 | **20.** - 2 | **30.** - 3 | **40.** - 3 | **50.** - 5 |

# II කොටස පිළිතුරු

01. (i) මානව සම්බන්ධතා රඳවා සිටින්නාවූත්, වර්ධනය කරන්නාවූත්, සියළු සංකේත මෙන්ම. ඒවා දේශයෙන් දේශයට ප්‍රවාහනය කිරීමටත්, කාලයේ බැඳුම් වලින් ඔබ්බට ගොස් සුරක්ෂිත කරගැනීමටත් උපකාරී වන උපක්‍රම සන්නිවේදනයයි. (චාල්ස් කුලී) (ල. 2)

(ii) සියළු ආකාරයේ සන්නිවේදන වර්ග 'බලය' උත්පාදනයට අවශ්‍ය පසුබිම සැකසීමට උදව් වේ.. යන ආකාරයට විෂය නිර්දේශයේ 2.2 කොටස ඇසුරින් පැහැදිලිකරතිබීම අවශ්‍ය වේ. (ල. 4)

(iii) * රූපවාහිනිය ඇතුළු ජනමාධ්‍ය සමාජය මත ඇතිකරන බලපෑම හසුරුවා ගැනීමට.
* මාධ්‍ය පරිහරණයට අවශ්‍ය දැනුමෙන් පුද්ගලයා සන්නද්ධ කිරීමට.
* සමාජය තුළ මාධ්‍ය පරිහරණයට අවශ්‍ය දැනුම, ආකල්ප හා කුසලතා වැඩි දියුණු කිරීමට.
* විචාරශීලී ග්‍රාහක පිරිසක් බිහිකිරීමට.
* මාධ්‍ය සාක්ෂරතාව හා මාධ්‍ය අධ්‍යාපනය පිළිබඳ කුසලතා අත්පත් කරදීමට.
* ජීවිතය පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය නිපුණතාවයක් බවට මාධ්‍ය පරිහරණය පත් කිරීම ... ආදී අවම කරුණු 6ක් සමග යෝග්‍ය පිළිතුරු සපයා තිබීම මත ලකුණු ලබාදිය හැකිය. **(ල. 6)**

(iv) වර්තමාන සමාජ සංස්කෘතික පසුබිම හා සමාජය තුළ ජනමාධ්‍ය පරිහරණය පිළිබඳ කාලීන විග්‍රහයක් අවශ්‍ය වේ. **(ලකුණු 8) එකතුව** 20

02. (i) * අන්තර්වර්තී පුද්ගල සන්නිවේදනය. * අන්තර් පුද්ගල සන්නිවේදනය. * සමූහ සන්නිවේදනය
* මහජන සන්නිවේදනය * ජන සන්නිවේදනය * අතර්‍ය සන්නිවේදනය **(ලකුණු 2)**

(ii) ජන සමූහයකය හෙවත් එකම ස්ථානයක පුළුල් ප්‍රදේශයක විසිරී සිටින ජන සමූහයකට මහා පරිමාණයෙන් සිදුකරන ඕනෑම සන්නිවේදනයක් මහජන සන්නිවේදනය නම් වේ. විෂය නිර්දේශයේ 3.1.4 කොටසට අදාළ ලක්ෂණ දක්වා ඇත්නම් ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 4)**

(iii) විෂය නිර්දේශයේ 4.2කොටසේ ගුවන් විදුලිය හා එහි ලක්ෂණ පිළිබඳ කොටස ආශ්‍රයෙන් මූලික ලක්ෂණ දක්වා තිබීම හා විස්තර කර තිබීම. **(ලකුණු 6)**

(iv) 3.1.5 ඒකකයට අදාළව කරුණු දක්වා ඇත්නම් ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 8) එකතුව** 20

03. (i) * පුද්ගලයන් දෙදෙනෙකු අතර සිදුවීම. * මුහුණට මුහුණ ලා සන්නිවේදනයේ යෙදීමේ හැකියාව.
* වාචික මෙන්ම අවාචික සන්නිවේදන විධික්‍රම භාවිතය
* බාධක අවම කරගත හැකිවීම.... ආදී වශයෙන් විෂය නිර්දේශයට අදාළව කරුණු 4ක් දක්වා තිබීම. **(ලකුණු 2)**

(ii) 1. අභිමුඛ පුද්ගලාන්තර සන්නිවේදනය
2. අනභිමුඛ පුද්ගලාන්තර සන්නිවේදනය. **(නම් කිරීමට ලකුණු 2, උදා: දැක්වීමට ල. 2)** **(ලකුණු 4)**

(iii) විෂය නිර්දේශයේ 4.1 කොටසට අදාළව කරුණු දක්වා තිබීම. **(ලකුණු 6)**

(iv) * සමාජ මාධ්‍ය යනු, * සමාජ මාධ්‍ය කොටස් 6 ක සංකලනයකි.
* සමාජ මාධ්‍ය ප්‍රභේද සහ ඒවායෙහි ක්‍රියාකාරිත්වය * වර්තමාන තරුණ පරපුරේ සමාජ මාධ්‍ය භාවිතය.
* සමාජ මාධ්‍ය සතු කාර්යභාරය සහ එය ඉටුවනවාද/ නොවන්නේද ආදී වශයෙන් සංවිධාන්තමක පිළිතුරක් සපයා තිබීම. **(ලකුණු 8) එකතුව** 20

04. (i) කිසියම් භාෂාවක් පදනම් කරගෙන වචන භාවිත කරමින් සිදුකෙරෙන සන්නිවේදනය.
* පුද්ගලයන් අතර තොරතුරු හුවමාරුව * ආදරය, කරුණාව වැනි ගුණාංග පිළිබඳව
* විවිධ කාර්යයන් ඉටුකර ගැනීම. * පෙළඹවීම.... ආදී වශයෙන් 3.2.1 ට අදාලව කරුණු සපයා තිබීම. **(ල. 2)**

(ii) 1. කාර්යක්ෂම බව. 2. අඩු පිරිවැය 3. ආරක්ෂිත බව
4. ශ්‍රව්‍ය දෘෂ්‍ය දර්ශන සහිතව සන්නිවේදනයේ යෙදීමේ හැකියා.. ආදී වශයෙන් 3.1.6ට අදාළව කරුණු දක්වා තිබීම සහ කෙටි පැහැදිලි කිරීම. **(ලකුණු 4)**

(iii) විෂය නිර්දේශයේ 3.3.3 ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතියට සහ ඇරිස්ටෝටලියානු ආකෘතිය ඇඳ විස්තර කර තිබීම අවශ්‍යයි. (ලකුණු 6)

(iv) **පුවත්පත -** ක්‍රි.පූ. 3000 සුමේරියානුවන් මැටි පුවරු භාවිතය සිට 1862 ලක්මිණි පහණ ලංකා රජයේ ලියාපදිංචි කල පළමු පුවත්පත දක්වා පුවත්පත් ඉතිහාසය.

**ගුවන්විදුලිය :-** 1844 සැමුවෙල් මෝස් ගේ ටෙලිග්‍රැෆික් පණිවිඩය නිර්මාණය කිරීම සිට 1825 ට්‍රාන්ස්මීටරයක් මගින් ශ්‍රී ලංකාවේ අඛණ්ඩව ගුවන් විදුලි විකාශනය දක්වා ගුවන් විදුලි ඉතිහාසය.

**සිනමාව :** 1826 ප්‍රංශ ජාතික ජෝසප් නිසිපොනිප්සේ ඡායාරූප ක්‍රමය සොයාගැනීම සී 1947 ශ්‍රී ලංකාවේ ප්‍රථම චිත්‍රපටය 'කඩවුණු පොරොන්දුව'දක්වා චිත්‍රපට ඉතිහාසය.

රූපවාහිනිය : විලෝග්බි ස්ටීන් විසින් සෙලනියම් මූලද්‍රව්‍ය භාවිතා කර කරන ලද සොයාගැනීම් වල සිට 1982 ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පිහිටුවීම දක්වා රූපවාහිනී ඉතිහාසය. **(ලකුණු 8) එකතුව 20**

05. (i) * රූපයක් බාගත කරගන්නේ කෙසේද?
* මාර්ගගත කතාවක පෙළට සබැඳියන් එකතු කරගන්නේ කෙසේද?
* ඡායාරූප සංස්කරණය සහ ඒවා වෙබ් පිටු වලට එකතු කරගන්නේ කෙසේද?
* වෙබ් පිටුවකට වීඩියෝවක් එකතු කරගන්නේ කෙසේද? ආදී නිපුණතා දක්වා තිබීම. **(ලකුණු 2)**

(ii) 1. මුද්‍රිත හා මාර්ගත මුද්‍රණය නිකුත්වීම. 2. නියමිත කාල පරතරයක් තුළ නිකුත් කිරීම.
3. කාලීන බව හා නැවුම් බව 4. ව්‍යාප්තිය පහසු කිරීම.... 4.2 පුවත්පත් කොටසට අදාලව කරුණු 4ක් දක්වා තිබීම හා ඒවා කෙටියෙන් පැහැදිලි කර තිබීම. **(ලකුණු 4)**

(iii) 1. වාචික සන්නිවේදනය. 2. නිර්වාචික සන්නිවේදනය
3. කථන සන්නිවේදනය. 4. ශ්‍රව්‍ය සන්නිවේදනය.
5. දෘෂ්‍ය සන්නිවේදනය. 6. ලිඛිත සන්නිවේදනය. **(විස්තර කර තිබීම අවශ්‍යයි)** **(ලකුණු 6)**

(iv) වර්තමාන ජනමාධ්‍ය ක්‍රියාවලියේ ස්වභාවය විනෝදාස්වාද සම්පාදනය, එය ඉටුවන ආකාරය, ජන මාධ්‍ය වගකීම් සහගත බව, මාධ්‍ය තරගකාරිත්වය තුළ අසාර සංදේශකරණය ආදී වශයෙන් විමර්ෂණාත්මක විග්‍රහයක් අවශ්‍යයි. **(ලකුණු 8) එකතුව 20**

06. (i) සන්නිවේදන වර්ග හා ස්වරූප පිළිබඳ අවධානය යොමු කිරීමෙන් විස්තර කර තිබීම හා තාක්ෂණයේ ආගමනයත් සමග සන්නිවේදනයේ ස්වරූප වෙනස් වීම ආදිය ඇතුළත්ව පැහැදිලි කර තිබීම. **(ලකුණු 2)**

(ii) 1. විධිමත් සංවිධානගත ආයතනික ව්‍යුහය 2. පොදු පණිවිඩ විසරණය
3. අසීමාන්ත ග්‍රාහක සංඛ්‍යාව 4. ප්‍රතිපෝෂණය නොලැබීම හෝ ප්‍රමාද වීම.
5. .... ආදී වශයෙන් ජන සන්නිවේදනයේ ලක්ෂණ 11 අතුරින් 4ක් දක්වා තිබීම සහ ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කර තිබීම. **(ලකුණු 4)**

(iii) * සරල ආකෘති රටා සහිතවීම. * තේමා අන්තර්ගතය * නම්‍යශීලී බව * සංස්කෘතික සම්බන්ධය
* පිරිවැය අවම වීම. * පහසුවෙන් සපයාගත හැකිවීම හා සමාජ උපයෝගීතාව
(ඉහත කරුණු විස්තර කර තිබිය යුතුයි)(ලකුණු 6)

(iv) Face Book, Twitter, Linkedin, skype, viber,whatsApp, qq, we chat ආදී සමාජ ජාල හා සමාජ මාධ්‍ය නම් කර තිබිම හා යොදාගත හැකි ආකාරය උදාහරණ සහිතව විස්තර කර තිබීම අවශ්‍යය. **(ලකුණු 8) එකතුව 20**

07. (i) * මානසික අවපීඩනය, කනස්සල්ල වැනි තත්ත්වයන් ඇතිවීම.
* ග්‍රාහකයන් ළබැඳියන් වීම. * පෞද්ගලිකත්වය පිළිබඳ ගැටළු මතුවීම.
* සයිබර් හිරිහැර * ප්‍රචණ්ඩ ක්‍රියාවලට පෙළඹීම. **(ලකුණු 2)**

(ii) 1.සෙවුම් යන්ත්‍ර 2. එක් අයෙකුගේ සිට තවත් අයෙකු දක්වා සිදුවන සන්නිවේදනය.
3. බොහෝ පිරිසකගේ සිට බොහෝ පිරිසක් දක්වා සිදුකෙරෙන සන්නිවේදනය.
4.එක් අයෙකුලේ සිට කිහිප දෙනෙකුට සිදුවන සන්නිවේදනය.
ඉහත කාණ්ඩ හතර දක්වා තිබීම ප්‍රමාණවත්ය. **(එකතුව 4)**

(iii) විෂය නිර්දේශයේ 4.2 කොටස ඇසුරින් පිළිතුරු සපයා තිබීම සහ අදාළ කරුණු විස්තර කරතිබීම සඳහා ලකුණු ලබාදිය හැකිය. **(ලකුණු 6)**

(iv) සන්නිවේදනයේ නියාමනය සිදුවන ආකාර දක්වාතිබීම. (සාම්ප්‍රදායික, මාධ්‍ය ආයතනික ආදී...) Hub ආකෘතියේ නියාමකයෝ කොටස ඇසුරින් කරුණු දක්වා තිබීම, ශ්‍රී ලංකාවේ වර්තමාන නියාමන ආයතන හා ක්‍රියාකාරිත්වය පැහැදිලි කර තිබීම, කාලීන ජන මාධ්‍ය ක්‍රියාකාරිත්වයේ යථා ස්වභාවය සහ නියාමනයේ අවශ්‍යතාව පිළිබඳ සමබර කාලීන විග්‍රහයක් දක්වා තිබීම දළ ලකුනු ලබාදිය හැකිය. **(ලකුණු 8) එකතුව 20**

**අවසාන ලකුණු = 100**